

2022

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

இலங்கைத் தேசிய பொறியியல் ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி நிலையம்

NATIONAL ENGINEERING RESEARCH AND DEVELOPMENT CENTRE OF SRI LANKA

අධ්‍යාපන අමාත්‍යාංශය

கல்வி அமைச்ச

Ministry of Education

පටුන

මාතෘකාව	පිටුව
1. පනත්, නීති හා ව්‍යවස්ථාපිත පාලනය	01
2. දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ, අරමුණු සහ ආයතනික වටිනාකම්	03
3. අධ්‍යක්ෂ මණ්ඩලය සහ සංවිධාන ව්‍යුහය	07
4. සභාපතිතුමාගේ පණිවුඩය	10
5. අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය	12
6. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය	14
7. මානව සම්පත් කළමනාකරණය	18
8. 2022 වසරේ කාර්ය සාධනය පිළිඹිමු කිරීම	23
9. 2022 වර්ෂයේ මධ්‍යස්ථානයේ මූල්‍ය සමාලෝචනය	32
10. පසුගිය වසර 10 තුල ආයතනයේ මූල්‍යමය ජයග්‍රහණ	48
11. විගණන කළමනාකරණ කමිටු සාරාංශය	50
12. 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව	52
13. විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පැහැදිළි කිරීම්	61



01.

පනත්, නීති හා ව්‍යවස්ථාපිත පාලනය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ ප්‍රතිපාදන අනුව දේශීය කර්මාන්ත, තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රයන්හි දියුණුව හා ප්‍රගමනය උදෙසා ව්‍යවස්ථාපිත පනතේ අරමුණු පෙරදැරිව 1974 වර්ෂයේ දී ජා ඇල, ඒකල, කාර්මික ජනපදය තුල පිහිටුවන ලදී. 2022 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ මෙම ආයතනය ක්‍රියාත්මක විය.

කාර්යාලීය ලිපිනය

2පී/17බී, කාර්මික ජනපදය
ඒකල, ජා ඇල.

ඇමතුම් විස්තර

+ 94-011-2236284
+ 94-011-2236384
+ 94-011-2236307
+ 94-011-5354597

බැංකු කරුවෝ

- ලංකා බැංකුව - ජා ඇල
- ලංකා බැංකුව - ආයතන ශාඛාව

විගණකවරු

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව



02.

දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ සහ ආයතනික වටිනාකම්

දැක්ම

"දකුණු ආසියාවේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය බවට පත්වීම"

අභිමතාර්ථය

"ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වන ඉංජිනේරුමය මැදිහත්වීම."

මෙහෙවර

"නව නිපැයුම් සහ ආයතනයේ කාර්ය මණ්ඩලය මෙන්ම ආයතනය පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන්ගේ නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය වන සංස්කෘතියක් ආයතනය තුල ඇති කරමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ඍජුව බලපෑමක් කළහැකි ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකරමින් ඉංජිනේරු තාක්ෂණයන් සංවර්ධනය, අත්පත් කරගැනීම, භාවිතා කිරීම හා පැවරීම"

අරමුණු

ශ්‍රී ලංකාජනික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධණ මධ්‍යස්ථානය 1957 අංක 49 දරණ රජය කර්මික නීතිගත සංස්ථාපනතේ ප්‍රතිපඳන අනුව 1974 අගෙස්තු 14 වන දින පහත සඳහන් අරමුණු පෙරදැව පිහිටුවාඇත.

1. ශ්‍රී ලංකාවේ නව සොයාගැනීම් සහ නිර්මණ කුසලතාවන්ට ධෛර්ය දීමෙන්ද, ඒවායේ සංවර්ධනයට ආධාර දීමෙන්ද, දේශීය තාක්ෂණය සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික ක්‍රම ඇති කිරීම සඳහාවිධිවිධාන සැළසීම.

2. සමූහික ප්‍රයත්නයන් ඵලදායී අයුරින් රජය අංශයේ සහ පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය ඉංජිනේරු සහ පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැළැස්වීම.

3. රටේ සම්පත් දායකයන්ට සහ ජනික ක්‍රම සම්පාදනයේ අරමුණු වලට අනුකූල වන තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයුක්ත කිරීමට සහ ඒවායෙදාගැනීමට වගබලා ගැනීම

4. අවශ්‍ය වූ විට ශ්‍රී ලංකාවේ රජය සහ පෞද්ගලික අංශයන්හි උචිත ආයතනයන්ට ඍජු ආකාරයෙන් සහ වක්‍ර ආකාරයෙන් තාක්ෂණික ශිල්පීය ක්‍රම මාරු කිරීමේ උපක්‍රම පරීක්ෂාකිරීම සහ ඒ ආයතනයන්ට උපදෙස් දීම.

5. උචිත තාක්ෂණික ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීමෙන් රටේ මානුෂික හාද්‍රව්‍යමය සම්පත් වලින් විශේෂයෙන්ම ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත් වලින් උපරිම උපයෝජනය අත්කර ගැනීමට අනුබල දීම.

6. කර්මික, වාණිජ සහ වෙනත් අරමුණු සඳහා යන්ත්‍ර භාවිතා කරන්නන් විසින් ඉල්ලුම් කරනු ලැබුවිට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රශාළා අරපිරිමැස්මෙන් යුක්තව සැළසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂාකර බැලීම.

7. ඉංජිනේරු ශිල්පීය සැළසුම් පර්යේෂණ පිළිබඳ තාක්ෂණික දත්තයන් සහ ලේඛණාගතය ජාත්‍යන්තර හා ජනික නියෝජිත ආයතනයන්ගේ සහයෝගයෙන් යුක්තව අඛණ්ඩව සමීක්ෂණය කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

8. රජය සහ පෞද්ගලික අංශයන්හි ව්‍යවසායනයට අඛන්ඩ උපදේශක සේවාවන් සැලසීම, රටේ ඉංජිනේරු සහ කර්මික සැළසුම් පදනම මෙන්ම පර්යේෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම.

9. ඉහත කී කරුණු වලට අදාළ ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සහ සම්බන්ධ කර්යයන් සඳහාවිධිවිධාන සැලැස්වීම.

ආයතනික වටිනාකම්

සමාජීය යහ පැවැත්මට දායක වන ගුණාත්මක නිෂ්පාදන, තාක්ෂණයන් සහ සේවාවන් සැපයීම සඳහා ආයතනයේ අපි ඇපකැපවී සිටිමු. අපගේ ආයතනික හා වෘත්තීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහළ ආචාරධර්ම ප්‍රමිතීන් අත්‍යාවශ්‍ය බව අපි විශ්වාස කරමු. එනිසා, ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධනයන්හි විශිෂ්ටත්වය උදෙසා නිර්මාණය කර ඇති ඉහළ කාර්යසාධන සංස්කෘතියක්, අපගේ කාර්යමණ්ඩල ගනුදෙනුකරුවන්, අනෙකුත් පර්ශවකරුවන් සහ ප්‍රජාව කෙරෙහි නර්ඩ ආයතනය කැපවීමේ මූලික වටිනාකම් වනුයේ ;





3.
අධ්‍යක්ෂ මණ්ඩලය සහ සංවිධාන ව්‍යුහය

සභාපති

මහාචාර්ය එස්.යූ. අධිකාරී මහතා
BSc.Eng.(Hons.), MSc, PhD, C.Eng., MIESL
(2022.11.03 සිට)

මහාචාර්ය ලීලානන්ද රාජපක්ෂ මහතා
PhD, MEng, BScEng., E Eng, FIMechE, MASHRAE, MIIAR, MIESL
(2022.11.02 දක්වා)

කේ.ඒ.එස්.එස්.කේ. පෙරේරා මහතා
MBA, PGDip, BA(Hons)
(2022.11.03 සිට)

ඉංජී. කපිල දොඩම්ගොඩ මහතා
MA Economics, FCMA, Fellow CMA (Ans),
CGMA, B.Sc Eng., AMIESL, MCIM, MSLIM
(2022.11.03 සිට)

එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද මහත්මිය
Msc
(2022.09.30 සිට)


ජේ. යෝගරාජා මහතා
B.Sc (Special in Computer Science),
Post Graduate in (Advanced IT) Japan
(2022.09.30 සිට)

එස්. ප්‍රසාද් ජයමාන්න මහතා
M.Sc. in Computer Science - Reading
M.Sc. in Applied Electronics
B.Eng. (Hons) in Mechatronics
B.Sc in Applied Science
(2022.09.30 සිට)

එම්.එච්.බී. සරත් කුමාර මහතා
BA (Hons) Economics,
MSSC (Economics),
PG Dip in (Environ & Regi. Dev.)
(2022.09.30 සිට)

එස්.ඒ.ඩී. තිලක් ප්‍රේමලාල් මහතා
(2022.11.03 සිට)


එච්.ඩී.එන්.කේ. හෙට්ටිආරච්චි මහත්මිය
MSc in Development Studies
(2022.02.22 සිට)


ශ්‍රී ලංකා ජාතික ඉඟිනෝරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
සංවිධාන ව්‍යුහය (අනුමත බඳවාගැනීම් පරිපාටිය අනුව)
සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)
අධ්‍යක්ෂ ඵලදායිතා සහ ව්‍යාපෘති සංවර්ධන අංශය
අධ්‍යක්ෂ බලශක්ති සහ පාරිසරික සේවා දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ මානව සම්පත්
අධ්‍යක්ෂ මූල්‍ය
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
ඉංජිනේරු (තාවකාලික)
ගෘහ නිර්මාණ ශිල්පී
පුස්තකාලයාධිපති
රහස්‍ය ලේකම්
සහකාර අධ්‍යක්ෂ (අලෙවි)
පාලක (තාවකාලික)
පාලක (වැටහෙ)
පාලක (ගණකාධිකාරී)
පාලක (පරිපාලන)
පාලක (ගබඩා



04.

සභාපතිතුමාගේ පණිවිඩය



රටේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන සංවිධානය වන ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (NERDC) 2022 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට සභාපතිවරයා වශයෙන් මම සතුටු වෙමි. නර්ඩ් ආයතනය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ඉංජිනේරුමය මැදිහත්වීම සැපයීමේ මූලික අරමුණු ඇතිව දශක පහකට පමණ පෙර 1974 වර්ෂයේදී පිහිටුවන ලදී. එතැන් සිට, නර්ඩ් ආයතනය ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන (R&D) ව්‍යාපෘති, නියමු ව්‍යාපෘති, වාණිජ ව්‍යාපෘති, උපදේශන සේවා, කර්මාන්ත සඳහා තාක්ෂණික සේවා, තාක්ෂණ ප්‍රවලිත කිරීම, සිසුන් සහ ප්‍රජාව අතර විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමෙහි නිරතව සිටිනු ලබයි .

නර්ඩ් ආයතනය ඉංජිනේරු පර්යේෂණ රටේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා ලබා දෙන ප්‍රධාන දායකත්වය වන්නේ කාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම, සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම, නව නිපැයුම්කරුවන්ගේ සහ තාක්ෂණික පිරිස්වල ධාරිතාව වර්ධනය කිරීම, ස්වයං රැකියා අවස්ථා නිර්මාණය කිරීම, නවීන තාක්ෂණික විසඳුම් පෝෂණය කිරීම යනාදියයි.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ රසායනික පොහොර භාවිතය තුරන් කිරීමට රජය දරන ප්‍රයත්නයට සමගාමීව රටපුරා කාබනික පොහොර ආදේශ කරමින් සහ “Vistas of Prosperity” මගින් ලබා දී ඇති උපදෙස් අනුව නර්ඩ් ආයතනය විසින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

මෙයට රටේ වත්මන් කෘෂිකාර්මික භූ දර්ශනය පිළිබඳ විමර්ශනයක් ද ඇතුළත් විය. ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති විධානයන්ට අනුව, ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති තුමාගේ මගපෙන්වීම යටතේ, නර්ඩ් ආයතනය ඔක්සිජන් සාන්ද්‍රකයේ නියමු ඒකකයක් සාර්ථකව සංවර්ධනය කර නිපදවා ඇත. ඔක්සිජන් සාන්ද්‍රණයක් යනු පරිසරයෙන් වාතය ඇද ගන්නා වෛද්‍ය උපකරණයක් වන අතර රෝගියාට ලබා දීම සඳහා කාමර ඔක්සිජන් චිකිත්සක මට්ටමට සාන්ද්‍රණය කිරීම සඳහා අණුක පෙරනයක් හරහා එය ගමන් කරයි. ජාතික විද්‍යා දිනය සැමරීම වෙනුවෙන් පැවති උත්සවයකදී එය අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගැන්වීමෙන් අනතුරුව එම උපකරණ අනුකූලතා පරීක්ෂණය සඳහා පෙව වෛද්‍ය පර්යේෂණ ආයතනය වෙත භාරදී ඇත.

නර්ඩ් ආයතනය බලශක්ති සහ පාරිසරික සේවා දෙපාර්තමේන්තුව කර්මාන්ත, වාණිජ ආයතන, රාජ්‍ය ආයතන ආදියෙහි බලශක්ති පද්ධති, කාර්මික ක්‍රියාවලි සහ පාරිසරික පද්ධති අධීක්ෂණය, පාලනය, වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම සහ වාතයේ ගුණාත්මකභාවය, අපජලය, ශීතකරණ, විදුලි ලාම්පු සහ මෝටර් රථ බැටරි සඳහා සම්මත පරීක්ෂණ පහසුකම් සැපයීම සිදුකරනු ලබයි. එය ISO17025:2017 ප්‍රතිඵලනය ලත් විද්‍යාගාර සමඟ අපජල විශ්ලේෂණය, ශබ්ද මට්ටම මැනීම, වායු තත්වය මිනුම්, විදුලි ලාම්පු පරීක්ෂාව සහ ශීතකරණ පරීක්ෂාව සඳහා වන විද්‍යාගාර වලින් සමන්විත වේ. 2022 වර්ෂය තුළ මෙම දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 23.6 ක ආදායමක් උත්පාදනය කරමින් කර්මාන්තයට සේවා 549 ක් සපයා ඇත.

සංවර්ධනය කරන ලද තාක්ෂණයන් ප්‍රවලිත කිරීමට සහ රටපුරා සුදුසු ව්‍යවසායකයින් වෙත තාක්ෂණය පැවරීම සඳහා, මධ්‍යස්ථානය විසින් 2022 වර්ෂය තුළ අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ආදර්ශන වැඩසටහන් වැනි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

ආයතනික ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ලබාදුන් දායකත්වය සහ සේවාවන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, ඉංජිනේරු සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය සහ අනෙකුත් සහායක කාර්ය මණ්ඩලයට ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

මහාචාර්ය එස්.යූ. අධිකාරි
සභාපති



05.

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය




ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 2022 වසරේ සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම්කළ බව දන්වනු ලබන්නේ ඉතා සතුටෙනි.

අප රටේ ප්‍රධානතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වශයෙන් නර්ඩ් ආයතනය පසුගිය මාස 12ක කාලය තුල බොහොමයක් අභියෝග වලට මුහුණදෙමින් නවතම පර්යේෂණ හා නවෝත්පාදන කටයුතුවල නියැලෙමින් හා කර්මාන්ත සේවා කටයුතු සිදුකර ඇත.

2022 වසරේදී නර්ඩ් ආයතනයේ ජාතික අවශ්‍යතාවයන්ට ආමන්ත්‍රණය කිරීම සඳහා කර්මාන්ත අංශය සමග සහයෝගීතාවයෙන් පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල නියැලෙනු ලැබූ අතර කාබනික පොහොර සෑදීම සඳහා ට්‍රැක්ටරයක් මගින් යාකළ හැකි වියලි කොළ කැබලි කරන යන්ත්‍රය හා කොම්පෝස්ට් පෙරලන යන්ත්‍ර නිර්මාණයකර සැකසීම හා මාළු කර්මාන්තයේ යෙදෙන ප්‍රජාව සඳහා තත්වයෙන් උසස් උම්බලකඩ සෑදීම සඳහා වියලන යන්ත්‍රයක් නිර්මාණයකර සෑදීම යන අවසන් කරන ලද ව්‍යාපෘති කිහිපයක් මෙහිලා සඳහන් කළ හැක.

මෙම සාර්ථකව නිමකල ව්‍යාපෘතීන් හා ලබාදුන් කර්මාන්ත සඳහා ලබාදුන් සේවාවන් සහ උපදේශක සේවාවන් රටෙහි ඉංජිනේරු හා කර්මාන්තවල යෙදෙන්නන් සඳහා නර්ඩ් ආයතනය මගින් සැලකිය යුතු දායකත්වයක් ලබාදුන් බව මැනවින් පෙන්නුම් කෙරේ.

ලබාදුන් සහයෝගය සඳහා සියලුම අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් හට මගේ හෘදයාංගම කෘතඥතාවය හා අවංක ස්තුතිය පුද කරමි. අවසාන වශයෙන් මම අධ්‍යක්ෂ ජනරාල් වරයාට, ජ්‍යෙෂ්ඨ කලමනාකාරිත්වයට, ඉංජිනේරු තාක්ෂණ ශිල්පීන්ට හා සහායක කාර්යය මණ්ඩලයට ඔවුන්ගේ අඛණ්ඩ කැපවීම හා සේවාදායකයන් හට උසස් සේවාවක් සැපයීම වෙනුවෙන් මගේ කෘතඥතාවය පලකරනු කැමැත්තෙමි.



ආචාර්ය ජයතු ජී සමරවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්



06.

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ ජනරාල්

ආචාර්ය ජයතු ජී සමරවික්‍රම මහතා
B.Sc. Eng. (Moratuwa), M.Sc. (Moratuwa),
PhD. (UNIGE and IIT, Italy), MIEEE
(2022.11.11 සිට)

Eng. D D Ananda Namal
M Eng. (Energy Technology), BSc Eng. (Hon), C Eng., MIE (SL)
(2022.11.10 දක්වා)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)

ඉංජි. ජේ.ඒ.ඒ.ඩී. ජයසූරිය මහතා
MEng., BScEng., MIE(SL)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සේවා)

ඉංජි. ඒ.ඒ.එස්.පී. ජයසිංහ මහතා
MBA, BScEng.(Hons), CEng., MIE(SL)

පර්යේෂණ විද්‍යාර්ථී

ඉංජි. එන්.ජී.ඩී. විජේසිරිවර්ධන මහත්මිය
MEng., CEng., FIE(SL)

ඉංජි. ඩබ්.කේ.ආර්. පීරිස් මහතා
MA (Buddhist Stud), BScEng., CEng. MIE(SL)

ඉංජි.ඊ්.ඒ.එන්.කේ. එදිරිසිංහ මහතා
MPHIL, BSC ENG., MIE (SL)

ඉංජි. කේ.ටී. ජයසිංහ මහතා
MEng., BScEng., C Eng., MIE(SL)

ඉංජිනේරු සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තු වශයෙන්

සිවිල් ඉංජිනේරු දොපර්තමේන්තුව

අධ්‍යක්ෂ (තාක්ෂණික)
ඉංජි. ජේ.ඒ.සී. ක්‍රිෂාන්ති මිය
M Eng., BSc Eng.,C Eng., MIE (SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජ. අයි.පී.බටුවිට මයා
MEng, BSc Eng. ,AMIE(SL)

ඉංජි. ඒ.එන්.එස්. අමරදාස මයා
BSc Eng., C Eng., MIE(SL)

ඉංජිනේරු
කේ.ඒ.එස්.එස්. වීරසිංහ මිය
Special Apprentice (Civil Eng.), IESL (Part I)
(2022.09.30 දක්වා)

කෘෂි ඉංජිනේරු සහ යන්ත්‍ර සංවර්ධන දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ (තාක්ෂණික)
ඉංජි. කේ.වයි.එච්.ඩී. ශාන්ත මයා
MScEng., BSc Eng., AMIE(SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. ඒ.ආර්.සී. සල්ගාදු මයා
BSc Eng., AMIE(SL)

ඉංජි. එස්.ජේ.ජී.එස්. දහනායක මයා
BSc Eng., C Eng., MIE(SL)

ආචාර්ය ඒ.පී.ඩී. ලියනගේ මයා
PhD, MSc, BSc

ජ්‍යෝෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු
ආචාර්ය ටී.එන්. ප්‍රනාන්දු මෙනවිය
PhD, B.Tech, AMIE (SL)

පර්යේෂණ ඉංජිනේරු
ඒ.බී.එම්.එල්.බී. අබේකෝන් මයා
BSc Eng., (up to 09.10.2022)

බලශක්ති සහ පාරිසරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

වැ.බ. දෙපාර්තමේන්තු ප්‍රධානී
ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එන්.එස්.එම්.ඩී.කේ. නානායක්කාර මයා
MEng., PG Dip, BScEng, AMI(SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එච්.එම්.එල්.යූ. හේරත් මයා
BSc Eng., AMIE(SL)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු
ආචාර්ය එස්.එම්. පතිරණ මයා
PhD, MSc, BSc, AMIE(SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. පී.එෆ්.එස්. පෙරේරා මයා
M Eng., BSc Eng., AMIE(SL)

ඉංජිනේරු
ඩබ්.ඒ.එල්.එස්. කරුණාවර්ධන මයා
HNDE

විදුලි හා විද්‍යුත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු / දෙපාර්මේන්තු ප්‍රධානී
එන් එස් කේ සමරසිංහ මයා
MScEng., BSc Eng., AMIE(SL)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. යූ.සී. බොතේජු මයා
BSc Eng., C Eng., MIE(SL)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. ඒ.ජී.එම්.ටී. සිරිවර්ධන මිය
MSc, MEng., BScEng., AMIE(SL)

ඩී.ඒ.එම්.එස්.කේ. හේමසිරි මයා
MSc, BSc.

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. ඩී.ආර්.එස්.කේ. විමලරත්න මයා
B Tech. (Hon.) AMIE (SL)

ඉංජි. වයි.එස්.පී. වීරසිංහ මයා
B Tech., AMIE(SL)

ඉංජි. එච්.කේ.අයි.එස්. ලක්මාල් මයා
BSc Eng., AMIE(SL) (2022.03.02 දක්වා)

මෙකට්‍රොනික්ස් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ/ දෙපාර්තමේන්තු ප්‍රධානී
ආචාර්ය ටී.ඒ.එස්. අනුරුද්ධ මයා
PhD, MSc. BSc(IT)

ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එච්.පී.එච්. කුමාර මයා
MSc Eng., EC(UK) PART I & II, AMIE(SL)

පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. ඩබ්.එම්.එස්.පී.කේ. වනසිංහ මයා
BTech., AMIE (SL)

ඉංජි. එස්.එම්.එස්.එස්. සේනාරත්න මයා
M Sc., BTech., AMIE (SL)

ඉංජි. අයි.ඩී.එම්.එච්. ජයන්තා මිය
BSc Eng., AMIE (SL)

බලශක්ති හා පාරිසරික කළමනාකරණ දෙපාර්තමේන්තුව

පර්යේෂණ ඉංජිනේරු / දෙපාර්තමේන්තු ප්‍රධානී
ඉංජි .ටී කේ ගිගනගේ මයා
M Sc, BSc Eng., AMIE (SL)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු
ඉංජි. එන්.පී.ටී. පෙරේරා මයා
MSc, BScEng.(Hons.), AMIE(SL)

පර්යේෂණඉංජිනේරු
එම්.ඩී. සහර්දීන් මයා
BSc Eng., AMIE(SL)

ඉංජි.කේ.පී.ඩී.ඩී. ජයසේකර මයා
BSc Eng.(Hons), AMIE(SL)

ඉංජි. ජී.එස්.ආර්. කොස්තා මිය
MEng, BScEng., AMIE (SL)

ඉංජි. එච්.ඒ.කේ. හපුආරච්චි මයා
BScEng ,.AMIE(SL)

ඉංජිනේරු
ඉංජි. එච්.ඩී.සී. හෙට්ටිආරච්චි මයා
NDT

සංවර්ධන හා ව්‍යාපෘති දෙපාර්තමේන්තුව	තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ (තාක්ෂණික) ඉංජි. කේ.එල්. මීදෙණිය මයා MSc Eng., BSc Eng., C Eng., MIE(SL)	**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු/ දෙපාර්තමේන්තු ප්‍රධානී** ඉංජි. පී.එම්.වයි.එස්. පතිරාජ මිය MSc Eng. BSc Eng., AMIE (SL)
ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු ඉංජි. ඩබ්.ඩබ්.පී.කේ. පෙරේරා මයා M Eng., BSc Eng. (Hons), C Eng., MIE (SL) ඉංජි. එස්.ඩී.එස්.පී. සෝලංගආරච්චි මයා MSc, BSc **ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු** ඉංජි. එම්.ඒ.ඩී.එස්. ප්‍රේමදාස මයා MBA, B Sc., AMIE(SL) **ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ (ගෘහ නිර්මාණ)** බී.ඩී.ආර්. වාමිකා මිය MSc, BSc. Chartered Architect AIA (SL) **ඉංජිනේරු** ඉංජි. ඩී.එම්.ඒ.කේ. දිගල මිය Special Apprentice (Civil Eng.), IESL (Part I) ඉංජි. පී.ඒ.යූ.ඩබ්.කේ. පරණගම්පල මයා NDES	**පර්යේෂණ ඉංජිනේරු** ඉංජි. ජේ.කේ.අයි.පී. ජයසිරි මයා BSc Eng., AMIE(SL) **පර්යේෂණ විද්‍යාඥ** බී.ඩී.පී.එස්. රණවීර මයා M Sc, BSc **සහකාර අධ්‍යක්ෂ (අළෙවි)** පී.එන්.ඩී. පතිරණ මයා BSc (Hons) Sp. MCIM (UK), MSLIM (SL) **තාක්ෂණික ඉන්කියුබේටර් අංශය** **ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු** ඉංජි. එස්.එ.පී. ශලින්ද සිල්වා මයා BSc Eng., M Eng. C Eng., MIE(SL) **පර්යේෂණඉංජිනේරු** සුරේෂ් පී පෙරේරා CEng(UK), MIMechE(UK), NDT, AMIE (SL) ඉංජි. එස්.එස්.වී.පී.ඩී. සේනානායක මයා BSc Eng., AMIE(SL) එච්.බී.එල්.එච්. ගුණසේකර මයා BSc Eng (2022.10.12 දක්වා)

නඩත්තු ඒකකය හා මධ්‍යම වැඩහල	තාක්ෂණ උද්‍යානය සහ ඉංජිනේරු කෞතුකාගාරය
ඉංජිනේරු එන්.ඒ.ඩී.ඩී.ජේ. ප්‍රසන්න මයා NDT	**පාලක - තාක්ෂණ උද්‍යානය** ඩබ්.කේ.සී.පී. වල්පොල මයා BSc **පාලක - කෞතුකාගාරය** ඩී.කේ. ජයවීර මිය BSc (Hons)

මානව සම්පත් දෙපාර්තමේන්තුව	මූල්‍ය දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ (මානව සම්පත්) ඩී.ඒ.එම්. මූණසිංහ මයා MBA (HRM) , BSc (HRM), AM (CIPM)	**අධ්‍යක්ෂ (මූල්‍ය)** ජේ.එම්.ආර.එස්. ජයසිංහ මයා MBA, BBA Sp. , CPFA, ICASL – Prof. Part I (2022.09.29 දක්වා)

තොරතුරු තාක්ෂණ අංශය	
ජාල පරිපාලක බී.පී. වික්‍රමසූරිය මයා MSc, BSc (Computing & Information Systems)	**පුස්තකාලයාධිපති** ඩී.එම්.ටී.පී.කේ. දේවගිරි මිය MMSc , B A (Library Science) Sp., ASLLA

අභ්‍යන්තර විගණන අංශය	ප්‍රසම්පාදන අංශය
අභ්‍යන්තර විගණක බී.පී. සුසන්ත මයා MPM, HNDA	**සැපයුම් නිලධාරී** ආර්.එච්.ඒ. ජීවානන්ද මයා BSc (Physical Science)



07.

මානව සම්පත් කළමනාකරණය

මානව සම්පත

සුවිශේෂී කාර්ය සාධනයක් තුලින් තම අරමුණු හා පරමාර්ථයන් සපුරාගැනීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්හි නියුතු ආයතනයන්හි ප්‍රධානතම වත්කම මානව සම්පත වේ. අනෙකුත් සම්පත් තුලින් යමක් සිදුවිය හැකි නමුත් යමක් ක්‍රියාවට නැංවීම සිදුකළ හැක්කේ මානව සම්පත තුලිනි. නිසි මගපෙන්වීම, මානව සම්පත ඵලදායීව උපයෝජනය කිරීම හා වැඩිදියුණු කිරීම තුලින් කාර්යක්ෂම සහ ඵලදායී සේවයක් ලබාගැනීම උදෙසා නර්ඩ් ආයතනයේ කළමනාකාරීත්වය නිරන්තරව උත්සාහ දරනු ලැබේ.


සුදුසුකම් සපිරි ඉංජිනේරු පර්යේෂකයින් සහ විද්‍යාඥයින් බඳවාගැනීම සහ රඳවාගැනීම ආයතනයේ මානව සම්පත් කළමනාකරණයේ හදුනාගත් ප්‍රධානතම ගැටළුව වේ. මෙම ගැටළුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතන බොහෝමයක් මුහුණුදෙන පොදු ගැටළුවක් බවට පත්ව ඇත. විද්‍යාත්මක, පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් ඇතිකිරීම, විද්‍යාත්මක හා ඉංජිනේරු පර්යේෂණ භාවිතයන් ජාතික සංවර්ධනය සඳහා අදාළ කරගැනීම, විද්‍යාඥයින්/ පර්යේෂකයින් රාජ්‍ය අංශය සඳහා බඳවාගැනීමේදී ඔවුන්ගේ වැටුප් හා ප්‍රතිලාභ කළමනාකරණය, පුහුණුව හා සංවර්ධනය යනාදිය සම්බන්ධයෙන් පුළුල් ඒකාබද්ධ උපාය මාර්ග ක්‍රියාත්මක කළ යුතුව ඇත.

වර්තමානයේ පවතින වැටුප් සහ දීමනා පරිපාටීන් යටතේ දක්ෂතා සපිරි ඉංජිනේරු පර්යේෂකයින් බඳවාගැනීමේ සහ රඳවාගැනීමේ ගැටළුව මධ්‍යයේ වුවද උසස් අධ්‍යාපන අවස්ථාවන්, පුහුණු හා සංවර්ධන අවස්ථාවන් ලබාදීම, ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ/ වැඩමුළු සඳහා යොමුකිරීම යනාදී වූ ආකර්ෂනීය ධාරිතා සංවර්ධන වැඩසටහන් වලට යොමුකිරීම මෙන්ම පහසුකම් සහිත වැඩ පරිසරයක් ඇතිකරලීම සහ රැකියා සංවර්ධන අවස්ථාවන් සඳහා පහසුකම් සළසාදීම යනාදීවූ ක්‍රමෝපායන් අනුගමනය කරමින් නිපුණතා සපිරි පර්යේෂකයින්, විද්‍යාඥයින් බඳවාගැනීම සහ ඔවුන් මධ්‍යස්ථානයේ සේවයේ රඳවාගැනීම සඳහා වූ හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම නර්ඩ් ආයතනය විසින් අනුගමනය කරමින් පවතී.

7.1 2022 වර්ෂයේ මධ්‍යස්ථානයේ සමස්ථ කාර්යමණ්ඩල තොරතුරු සාරාංශය - 31.12.2022 දිනට

සේවා බාණ්ඩය	අනුමත කාර්යය මණ්ඩලය	තත්‍ය කාර්යය මණ්ඩලය
ඉහළ කළමනාකාරීත්වය	3	2
ඉංජිනේරු /විද්‍යාඥ	68	48
අනෙකුත් විධායක	10	6
කණිෂ්ඨ කළමණාකාර	14	7
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	25	19
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	52	48
ප්‍රාථමික ශිල්පීය	107	74
ප්‍රාථමික අර්ධ ශිල්පීය	3	0
ප්‍රාථමික ශිල්පීය නොවන	65	31
එකතුව	**347**	**235**

31.12.2022 දිනට තත්‍ය කාර්යමණ්ඩල සාරාංශය



7.2 සේවක සංඛ්‍යා කළමනාකරණය

- රජය විසින් පනවන ලද විදිවිධාන මත 2022 නව බඳවාගැනීම් සිදු නොකෙරුණි
- සේවයෙන් විශ්‍රාම ගැනීම් සහ සේවයෙන් ඉල්ලා අස්වීම් 2022

	නම	තනතුර	සේවා ඛාණ්ඩය	දිනය
විශ්‍රාම ගැනීම්				
1	කේ.එස්.එස්. වීරසිංහ මිය	ඉංජිනේරු	MM 1-1	2022/09/30
2	ඩබ්.එල්.එම්.ජේ. පෙරේරා මයා	කම්කරු	PL-3	2022/10/05
3	එන්.එල්. ජයවික්‍රම මයා	විදුල් කාර්මික	PL-3	2022/10/05
4	ඩබ්. බෙනී සිල්වා මයා	කම්කරු	PL-3	2022/10/05
5	ඉංජි. ඩී.ඩී.ඒ. නාමල් මයා	අධ්‍යක්ෂ ජනරාල්	HM 2-3	2022/10/05
6	ඉංජි. ජේ.ඒ.ඒ.ඩී. ජයසූරිය මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)	HM 2-1	2022/12/31
7	ඉංජි. එන්.ඩී.ජී. විජේසිරිවර්ධන මිය	පර්යේෂණ විද්‍යාර්ථී	HM 2-1	2022/12/31
8	ඒ.ජී.එන්.පී.කේ. අන්හෙට්ටිගම මිය	ගිණුම් සහකාර	JM 1-2	2022/12/31
9	ඩබ්.පී.එස්.ඒ. ජූඩ් පෙරේරා මයා	වැද්දුම්/ පෑස්සුම්කරු	PL-3	2022/12/31
10	ටී. ආනන්ද ප්‍රනාන්දු මයා	වඩු කාර්මික	PL-3	2022/12/31
සේවයෙන් ඉල්ලා අස්වීම				
1	ඩබ්.බී.එස්.ඕ. අබේවර්ධන මයා	විද්‍යුත් කාර්මික	PL-3	2022/01/19
2	ඩබ්.කේ.සී.පී. වල්පොල	පාලක - තාක්ෂණ උද්‍යානය	JM 1-2	2022/02/11
3	ඉංජි. එන්.කේ.අයි.එස්. ලක්මාල්	පර්යේෂණ ඉංජිනෙරු	AR -1	2022/03/02
4	එච්.ඩබ්.ජී.ආර්.එල්. හෙට්ටිගෙවත්ත	කාර්යාල සහායක	PL-1	2022/03/18
5	එම්.එස්. ආනන්ද මයා	කළමනාකරණ සහකාර	MA 1-2	2022/06/03
6	ජී.එස්. සමන්නාත් මයා	පෙදරේරු	PL-3	2022/05/01
7	බී.ජේ.ඒ. ධර්මරත්න මයා	කළමනාකරණ සහකාර	MA 1-2	2022/07/01
8	ඊ. ප්‍රේමරත්න මයා	යන්ත්‍රශිල්පී	PL-4	2022/08/05
9	පී.අයි. අධිකාරි මිය	සැළසුම්ශිල්පී	MA 2-2	2022/09/15
10	ජේ.එම්.ආර්.එස්. ජයසිංහ මයා	අධ්‍යක්ෂ (මූල්‍ය)	HM 1-3	2022/09/29
11	කේ.එන්.කේ.ඩී. පෙරේරා මයා	වැද්දුම්/ පෑස්සුම්කරු	PL-3	2022/11/22
12	එම්. සමීර සංජය මයා	කම්කරු	PL-1	2022/09/22
13	එච්.බී.එල්.එච්. ගුණසේකර මයා	පර්යේෂණ ඉංජිනේරු	AR -1	2022/10/12
14	ඒ.බී.එම්.එල්.බී. අබේකෝන් මයා	පර්යේෂණ ඉංජිනේරු	AR -1	2022/10/09
15	ජී.ජී.එස්. ප්‍රියංගිකා මිය	කළමනාකරණ සහකාර	MA 1-2	2022/11/01
16	අයි.ආර්. සරත් මයා	මෝටර් කාර්මික	PL-3	2022/11/22
17	කේ.එම්.ටී.සී.බී. කෝනාර මයා	කාර්යාල සහායක	PL-1	2022/12/01
18	එස්.ඩබ්. අබේවර්ධන මයා	කාර්යාල සහායක	PL-1	2022/12/01

7.3 පුහුණුව හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය

නර්ඩ් මධ්‍යස්ථානයෙහි ප්‍රමුඛ වගකීම වන්නේ ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධනයන් වන බැවින් මධ්‍යස්ථානයේ මානව සම්පත් ධාරිතාවය වර්ධනය කෙරෙහි නිරන්තර අවධානය යොමු කෙරේ. ඒ අනුව කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබාගැනීම සඳහා කාර්යමන්ඩලයේ වෘත්තීය සංවර්ධනය අරමුණු කරගත් කාර්යමණ්ඩලයේ සියලුම සේවා කාණ්ඩවල නිවැරදි ආකල්ප වලින් හෙබි දැනුම, කුසලතා සහ නිපුණතා වැඩිදියුණු කිරීමට කළමනාකාරීත්වය විසින් සියලු පියවර නිරන්තරයෙන් ගනු ලැබේ.

2022 වර්ෂයේදී නර්ඩ් මධ්‍යස්ථානය කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් පරිදි පුහුණු හා සංවර්ධන අවස්ථාවන් සළසා ඇත.

7.3.1 පශ්චාත් උපාධි/ වෘත්තීය සුදුසුකම් සපුරාලීම සඳහා පහසුකම් සැළසීම

2022 වසර තුළ කරගෙන යනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාවන්				
	නම	තනතුර	වැඩසටහන	ආයතනය
01	ඉංජි. ජේ.කේ.අයි.පී. ජයසිරි මිය	පර්යේෂණ ඉංජිනේරු	M/Eng. PG Diploma in Energy Technology	මොරටුව විශ්වවිද්‍යාලය
02	ඉංජි. එස්.ඒ.පී. ශලින්ද සිල්වා මයා	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	PhD Studies	මොරටුව විශ්වවිද්‍යාලය

7.3.2 අභ්‍යන්තර පුහුණු වැඩසටහන්

	පුහුණු වැඩසටහන	කාලසීමාව	කා සඳහා ද	සහභාගී වූ සංඛ්‍යාව
01	Good Housekeeping Practices and Workshop Safety Training	2022.08.31	ඉංජිනේරු/ විධායක ශ්‍රේණි කළමනාකරණ සහකාර (තාක්ෂණික) කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ප්‍රාථමික කාර්ය මණ්ඩල	50
02	ලිපිගොනු කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	2022.08.31	ඉංජිනේරු/ විධායක ශ්‍රේණි කළමනාකරණ සහකාර (තාක්ෂණික) කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ප්‍රාථමික කාර්ය මණ්ඩල	43
03	ට්‍රෙලෝ ව්‍යාපෘති කළමනාකරණ මෙවලම් හැඳින්වීම පිළිබඳ ඉදිරිපත් කිරීම	2022.11.29	ඉංජිනේරු/ විධායක ශ්‍රේණි කාර්ය මණ්ඩල	35
04	ශ්‍රී ලංකාවේ ජලාපවහන අරමුණු සඳහා වැසි ජලය රැස් කිරීම පිළිබඳ ඉදිරිපත් කිරීම	2022.11.22	ඉංජිනේරු/ විධායක ශ්‍රේණි කළමනාකරණ සහකාර (තාක්ෂණික) කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ප්‍රාථමික කාර්ය මණ්ඩල	24

7.3.3 දෙශීය පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ සම්මන්ත්‍රණ

	නම සහ තනතුර	සහභාගී වූ වැඩසටහන	මෙහෙයවීම	දිනයන්
1	ඉංජි. කේ.පී.ඩී.ඩී. ජයසේකර මයා පර්යේෂණ ඉංජිනේරු	සම්පත් කාර්යක්ෂමතාව සහ ආර්ථිකය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - 2022	ශ්‍රී ලංකා ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය	2022.01.19
2	ඉංජි. එන්.පී.ටී. පෙරේරා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු			
3	ඉංජි. එන්.පී.ටී. පෙරේරා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	ISO/IEC 17043:2010 සඳහා තක්සේරුකරණ පුහුණු පාඨමාලාව	ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB)	2022.03.21-2022.03.25
4	කේ.ටී. පියුමලී මිය ඉංජිනේරු සහකාර	කළමනාකරණ නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩමුළුව	ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB)	21.03.2022 to 22.03.2022
5	ඩී.ආර්.එස්.කේ. විමලරත්න මිය පර්යේෂණ ඉංජිනේරු			
6	ඉංජි. වයි.එස්.පී. වීරසිංහ මයා පර්යේෂණ ඉංජිනේරු			
7	ඉංජි. එන්.එස්.කේ. සමරසිංහ මයා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු			
8	ඩී.ඒ.එම්.එස්.කේ. හේමසිරි මයා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු			
9	යූ.ඒ.එන්. ප්‍රනාන්දු මිය කළමනාකරණ සහකාර	ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	නිපුණතා සංවර්ධන අරමුදල	25.03.2022
10	කේ.බී.එච්.වී. ලෙයිටන් මිය කළමනාකරණ සහකාර			

	නම සහ තනතුර	සහභාගී වූ වැඩසටහන	මෙහෙයවීම	කාලපරිච්ඡේදය	සහභාගීවූවන්
11	ජේ.ඩී. ජනනි වාසනා මෙනවිය කළමනාකරණ සහකාර	අවසන් ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ වැඩමුළුව	නිපුණතා සංවර්ධන අරමුදල (SDFL)	2022.03.10-11	01
12	බී.ඒ.එල්.පී. බල්ලෑගල මිය කළමනාකරණ සහකාර	පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය	නිපුණතා සංවර්ධන අරමුදල (SDFL)	2022.03.30-2022.03.31	03
13	එම්.ජී.එන්.එන්. ගමගේ මිය කළමනාකරණ සහකාර				
14	පී.ඊ.එන්.පී. පෙරේරා කළමනාකරණ සහකාර				
15	ඉංජි. එම්.ඩී. සහර්දීන් මයා පර්යේෂණ ඉංජිනේරු	ISO 50001:2018 හි උපදේශක සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන	ශ්‍රී ලංකා ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය	2022.03.28-2022.04.01	01
16	ඉංජි. එන්.පී.ටී. පෙරේරා මිය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු	EnMS Expert Training Program - Con	ශ්‍රී ලංකා ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය	2022.10.19-20 2022.11.22-24	01
17	ඉංජි. කේ.පී.ඩී.ඩී. ජයසේකර මයා පර්යේෂණ ඉංජිනේරු	රසායනික ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	ශ්‍රී ලංකා ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය	2022.10.27-28	01
18	ඉංජි. අයි.පී. බටුවිට මයා පර්යේෂණ ඉංජිනේරු	Workshop on Building Life Cycle Assessment	GBCSL	2022.11.25-26	01
19	කේ.ටී. පියුමලි මිය ඉංජිනේරු සකාර	ගොඩනැගිලි සඳහා විදුලි පද්ධති නිර්මාණය පිළිබඳ පුහුණු වැඩසටහන	ඉදිරිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය CETRAC	2022.12.15-17	02
20	ඉංජි. ඩී.ආර්.එස්.කේ. විමරලරත්න පර්යේෂණ ඉංජිනේරු				
21	ඉංජි. ඊ.ඒ.එන්.කේ. එදිරිසිංහ	ශ්‍රී ලංකාවේ ඛනිජ කර්මාන්තය සඳහා අගය එකතු කළ අවස්ථා සහ උපාය මාර්ග පිළිබඳ සම්මන්ත්‍රණය	කාර්මික සංවර්ධන මණ්ඩලය	2022.12.30	10
22	ඉංජි. කේ.එල්. මීදෙණිය මයා				
23	ඉංජි. එන්.පී.ටී. පෙරේරා මිය				
24	ආචාර්ය ටී.ඒ.එස්. අනුරුද්ධ මයා				
25	ආචාර්ය ඒ.ජී.එම්.ටී. සිරිවර්ධන මෙනවිය				
26	ඉංජි. පී.එම්.වයි.අස්. පතිරාජ මයා				
27	ඉංජි. එස්.ඒ.පී. ශලින්ද මයා				
28	ඉංජි.කේ.පී.ඩී.ඩී.ජයසේකර මයා				
29	ඉංජි. ඩී.ආර්.එස්.කේ. විමරලරත්න පර්යේෂණ ඉංජිනේරු				
30	ඉංජි. අයි.පී. බටුවිට මයා පර්යේෂණ ඉංජිනේරු				



08.

2022 වසරේ කාර්යසාධනය පිළිබිඹු කිරීම

8.1 ප්‍රධාන පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිවල විශේෂ අවස්ථා

නිමකරන ලද පර්යේෂණ ව්‍යාපෘති

8.1.1 කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර නිර්මාණය කිරීම හා සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ රසායනික පොහොර භාවිතය ඉවත් කිරීම සඳහා කාබනික පොහොර ආදේශයක් වශයෙන් භාවිතා කිරීමට "සෞභාග්‍යයේ දැක්ම" මගින් ලබා දී ඇති උපදෙස් අනුව NERDC විසින් කාබනික පොහොර නිපදවීමේදී භාවිතා කරන යන්ත්‍ර නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙහිදී අප විසින් වර්තමාන කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතීන් පිළිබඳව අධ්‍යනයක් සිදු කරන ලදී.

මෙම අධ්‍යනයේදී කාබනික පොහොර සෑදීම සඳහා ජීව පදාර්ථ කැබලිකරන/හලන (Shredder/crusher) යන්ත්‍ර හා කොම්පෝස්ට් ගොඩවල් පෙරලන යන්ත්‍ර (Compost Turner) අවශ්‍ය බවට හඳුනාගන්නා ලදී. මේ අනුව නර්ඩ ආයතනය මගින් ආරක්ෂිත සහ කාර්යක්ෂමතාවයට මුල්තැන දෙමින් විශ්වාසනීය, සරල සහ පහසුවෙන් ක්‍රියාකරවිය හැකි බලශක්ති කාර්යක්ෂමතාවයෙන් යුතු කාබනික පොහොර නිෂ්පාදනයේදී භාවිතා කරන යන්ත්‍ර කිහිපයක් නිපදවන ලදී.

- **කැබලිකරන යන්ත්‍ර (මධ්‍යම ප්‍රමාණයේ)**

මෙම යන්ත්‍ර පහසුවෙන් ප්‍රවාහනය කළ හැකි පරිදි රෝද මත සවිකර ඇති මෙම කැබලි කරන යන්ත්‍රයෙන් කොම්පෝස්ට් පොහොර යෙදීම සඳහා සුදුසු වන පරිදි 1/2 "-1 ½ " ප්‍රමාණයේ කැබලි නිපදවනු ලබයි.

ධාරිතාවය : පැයට කිලෝග්‍රෑම් 350-400

බල සැපයුම: කිලෝවොට් 5 ධාරිතාවයෙන් යුත් ටෙකලා විදුලි මෝටරයක් හා අශ්වබල 7-8 ධාරිතාවයෙන් යුතු රෝද දෙකේ ට්‍රැක්ටරයක් මගින්.




***Shredder/Crusher** සවිකර ඇති රෝද හතරේ ට්‍රැක්ටරය (මධ්‍යම පරිමාණය)*

- **කැබලි කරන යන්ත්‍ර (විශාල ප්‍රමාණයේ)**

විශාල ප්‍රමාණයේ නිෂ්පාදන ධාරිතාවයක් ඇති කැබලි කරන යන්ත්‍ර නිර්මාණයකර ඇත්තේ PTO උපකරණය හරහා රෝද හතරේ ට්‍රැක්ටරයකට සවිකිරීමටය.

ධාරිතාවය : පැයට කිලෝග්‍රෑම් 1500-2000

බල සැපයුම : ධාරිතාවය අශ්ව බල 25-45 වන රෝද දෙකේ ට්‍රැක්ටරයකට සවිකිරීම මගින්.



කැබලි කරන යන්ත්‍ර (විශාල ප්‍රමාණයේ)

- **කොම්පෝස්ට් පෙරලීමේ යන්ත්‍රය (විශාල ප්‍රමාණයේ)**

විශාල ප්‍රමාණයේ කොම්පෝස්ට් නිෂ්පාදනයන් සමතලා බිමක සිදු කරනු ලබන කොම්පෝස්ට් ගොඩ පෙරලීමේ කාර්යේදී, රෝද හතරේ ට්‍රැක්ටරයකට සම්බන්ධකර භාවිතා කල හැකි වන ලෙස මෙම කොම්පෝස්ට් පෙරලීමේ යන්ත්‍රය නිර්මාණයකර ඇත.

පෙරලීමේ ධාරිතාවය: **පැයට මීටර100 (කොම්පෝස්ට් ගොඩොහී පලල මීටර් 1.5)**

බල සැපයුම : ධාරිතාවය අවම වශයෙන් අශ්ව බල 45 ක් වන ද්විත්ව ක්ලචයක් (double clutch) සහිත රෝද හතරේ ට්‍රැක්ටරයක් මගින්



කොම්පෝස්ට් ටර්නර්- රෝද හතරේ ට්‍රැක්ටරය සවි කර ඇත (විශාල පරිමාණ)

මෙම යන්ත්‍රයේ ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා නර්ඩ් ආයතනය දිවුලපිටිය ප්‍රාදේශීය සභාව සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති අතර මෙම යන්ත්‍රය භාවිතයෙන් සාර්ථක ලෙස ක්ෂේත්‍ර පරීක්ෂණය සිදුකර ඇත. මෙම යන්ත්‍රය කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මිලදී ගැනීමට දිවුලපිටිය ප්‍රාදේශීය සභාව එකඟවිය.

8.1.2 මාළු අල්ලීම ජීවිකාව කරගත් ධීවර ප්‍රජාව සඳහා උම්බලකඩ සෑදීම සඳහා වියලනයක් නිර්මාණය හා සංවර්ධනය කිරීම යාකාරිත්වය පරීක්සා කිරීම හා ක්‍රියාත්මක කිරීම

මෙය නර්ඩ් ආයතනය හා ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන කාර්යාංශය (NARA) සමග ක්‍රියාත්මක කරන ලද සහයෝගී ව්‍යාපෘතියකි. නර්ඩ් ආයතනය මගින් මෙම ස්වභාවික සංවහන වර්ගයේ වියලනයක් නිෂ්පාදනය කරනු ලැබුවේ දැනට ප්‍රධාන වශයෙන් භාවිතා වන හිරු එළියෙන් වියලීමේදී ඇතිවන දුර්වලතා මග හරවා උසස් තත්වයේ උම්බලකඩ නිෂ්පාදනය කිරීම සඳහාය. මෙම වියලනය මගින් උම්බලකඩ සඳහා ආවේනික පෝෂ්‍ය හා සංවේදී ගුණාංග ආරක්ෂා වන පරිදි උම්බලකඩ නිෂ්පාදනය කල හැක. මෙම වියලනය විශේෂ වශයෙන් ගෘහස්ථ මට්ටමින් උම්බලකඩ නිෂ්පාදනය කරන මාළු ඇල්ලීම ජීවිකාව කරගත් ප්‍රජාව සඳහා යෝග්‍ය වන පරිදි නිපදවා ඇත.

මෙම වියලනයේ ක්ෂේත්‍ර පරීක්ෂාව එය ඉදිකර ඇති මාතර දික්වැල්ල කෝට්ටෙගොඩදී සිදු කරන ලදී. මෙම ස්වභාවික සංවහන වර්ගයේ වියලනයෙන් මාළු දුම්ගැසීම හා උම්බලකඩ සෑදීම සඳහා වියලීම සිදුකල හැක. මෙම වියලනය සඳහා ඉන්ධන වශයෙන් දර භාවිතා කරන බැවින් වර්ෂා කාලයේදී වුවද භාවිතා කල හැකි වීම මෙහි වාසියකි. වියලනයේ ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීමේදී පිරිසිදුකර ලුණු දමා තම්බන ලද බලයා මාළු කිලෝග්‍රෑම් 1000ක්, භාවිතා කරන ලදී. මෙසේ සකසන ලද මාළු දුම්ගැසූ පසු දහවල් කාලයේදී පමණක් දර දම්මින් දින 4ක කාලයක් තුළදී මෙම වියලනය මගින් අවශ්‍ය තත්වයට වියලා ගත හැකි බව නිරීක්ෂණය කරන ලදී.



ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා ස්ථාපිත කරන ලද වියලනය



නාරා ආයතනය සමග වියලනය පරීක්ෂා කිරීම



වියලීම සඳහා සූදානම් කරන ලද තම්බා දුම් ගසන ලද මාළු



වියළීමෙන් පසු නිෂ්පාදනය කරන ලද උම්බලකඩ

උම්බලකඩ වියලනයේ පිරිවිතර

- වර්ගය : *ස්වභාවික සංවර්ධනධාරා*
- ඉන්ධන : දර
- මානයන්: 6.2 මීටර් x1.6 මීටර් x 3.2 මීටර්
- ධාරිතාව : ලුණු දමා තම්බන ලද මාළු කිලෝග්‍රෑම් 1000
- තැටිවල වර්ගඵලය : 37.5 වර්ග මීටර්
- වියලීමේ උෂ්ණත්වය : 400°C -480°C
- වියලීමේ කාලය : පැය 48
- ඉන්ධන වැයවීම : පැයට කිලෝග්‍රෑම් 7-12
- චිමිනියේ දිග : 3.2 මීටර්

8.1.3 ඔක්සිජන් සාන්ද්‍රණය කිරීමේ යන්ත්‍රය නිෂ්පාදනය

ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති තුමාගේ යොමු කිරීම හා පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය ඇමතිතුමාගේ මග පෙන්වීමට අනුව නර්ඩ ආයතනය මගින් මෙම ඔක්සිජන් සාන්ද්‍රණය කිරීමේ ආදර්ශ යන්ත්‍රයක් සංවර්ධනයකර නිෂ්පාදනය කරන ලදී. ඔක්සිජන් සාන්ද්‍රණය කිරීමේ උපකරණය මගින් වායුගෝලයේ වාතය අනුක පේරණයක් තුළින් යවා එහි ඔක්සිජන් සාන්ද්‍රණය චිකිත්සක මට්ටම දක්වා ඉහල යවා රෝගීන් වෙත යැවීමට සලස්වයි. මෙම උපකරණ පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ජීව වෛද්‍ය පරීක්ෂණ ආයතනය වෙත භාර දී ඇත. ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා NMRA ආයතනයේ අනුමැතිය බලාපොරොත්තු වේ.

8.2 විශේෂිත කර්මාන්තමය සේවාවන්

8.2.1 බලශක්ති සහ පරිසර සේවා දෙපාර්තමේන්තුව (E&ESD)

NERDC මධ්‍යස්ථානයේ බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව (E&ESD), කර්මාන්ත, වාණිජ ආයතන, රාජ්‍ය ආයතන ආදියෙහි බලශක්ති පද්ධති, කාර්මික ක්‍රියාවලි සහ පාරිසරික පද්ධති අධීක්ෂණය, පාලනය, වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම සහ වාතයේ ගුණාත්මකභාවය, අපජලය, ශීතකරණ, විදුලි උපකරණ සඳහා සම්මත පරීක්ෂණ පහසුකම් සැපයීම සඳහා සම්බන්ධ වේ. ලාම්පු සහ මෝටර් රථ බැටරි. එය ISO17025:2017 ප්‍රතිනතය ලත් විද්‍යාගාර සමඟ අපජල විශ්ලේෂණය, ශබ්ද මට්ටම් මිනුම්, වායු තත්ත්ව මිනුම්, විදුලි ලාම්පු පරීක්ෂාව සහ ශීතකරණ පරීක්ෂණ සඳහා ක්‍රියාත්මක වේ. 2022 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් කර්මාන්තයට සේවා 549ක් සපයා ඇති අතර එමඟින් රුපියල් මිලියන 23.6ක ආදායම් උත්පාදනය කර ඇත.

බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුවේ වාණිජ ක්‍රියාකාරකම් ඉලක්ක සහ ජයග්‍රහණ 2022 දී භෞතික හා මූල්‍ය ඉලක්ක සහ වාණිජ ක්‍රියාකාරකම් වල ජයග්‍රහණ පිළිබඳ සාරාංශයක් පහත වගුවේ දක්වා ඇත.

2022 දී වාණිජ ක්‍රියාකාරකම් ඉලක්ක සහ ජයග්‍රහණ E&ESD 2022

ව්‍යාපෘතිය / යාකාරකම්	භෞතික (සේවා ගණන)		මූල්‍ය (LKR මිලියනය)					
			ආදායම්			දායකත්වය		
	ඉලක්ක	ජයග්‍රහණ	ඉලක්ක (LKR)	ජයග්‍රහණ (LKR)	ඉලක්කය ඉක්මවා ජයග්‍රහණ (%)	ඉලක්ක (LKR)	ජයග්‍රහණ (LKR)	ඉලක්කය ඉක්මවා ජයග්‍රහණ (%)
කර්මාන්ත සඳහා සේවා	952	49	30.5	21.	71.5	25.5	12.3	48.2
කර්මාන්ත සඳහා රසායනාගාර පරීක්ෂණ	275	55	5.5	1.7	30.9	3.3	0.2	6.0
පුහුණු වැඩසටහන්	2	1	0.1	0.1	100	0.3	0.0	0.0
එකතුව	**1229**	**549**	**36.1**	**23.6**	**67%**			**18%**

කර්මාන්ත සඳහා සේවා

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වාණිජ කටයුත්ත වන්නේ කාර්මික සේවා සැපයීමයි. විවිධ කර්මාන්ත සඳහා ඔවුන්ගේ ඉල්ලීම් මත පදනම්ව පහත සේවාවන් සපයනු ලැබේ.

- බොයිලේරු විශ්ලේෂණය, සුසර කිරීම සහ කාර්යක්ෂමතා පරීක්ෂණ
- කාර්මික ක්‍රියාවලි අධීක්ෂණ සේවා
- ශබ්ද සහ වායු තත්ත්ව පාලන පද්ධති සැලසුම්
- විමෝචන පාලන පද්ධති සැලසුම්
- ප්‍රමිතීන් මත පදනම්ව ශබ්ද සහ වායු තත්ත්ව අධීක්ෂණ සේවා
- ස්ථාවර මූලාශ්‍ර විමෝචන අධීක්ෂණ සේවා ප්‍රමිතීන් මත පදනම්ව
- OSHA ප්‍රමිතිය මත පදනම්ව ගෘහස්ථ වායු තත්ත්ව අධීක්ෂණය.

2022 දී කාර්මික සේවා හරහා ආදායම් ඉලක්කය සහ ජයග්‍රහණය පිළිවෙලින් රුපියල් මිලියන 30.5ක් සහ රුපියල් මිලියන 21.8ක් විය. අපේක්ෂිත දායකත්වය ඉලක්කය සහ ජයග්‍රහණය පිළිවෙලින් LKR මිලියන 25.5 සහ LKR මිලියන 12.3 විය.

විවිධ ක්‍රියාකාරකම්වල සිදුකරන ලද සේවාවන් සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.

ක්‍රියාකාරකම් වර්ගය	සේවා ගණන
ස්ථාවර මූලාශ්‍ර දහන පද්ධති බොයිලේරු කාර්ය සාධනය සහ විමෝචනය අධීක්ෂණය	167
රෙගුලාසි වලට අනුව ශබ්ද මට්ටම මැනීම	127
රෙගුලාසි වලට අනුව අවට වාතයේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම	96
කර්මාන්තවල පාරිසරික ගැටළු පාලනය කිරීමට විසඳුම් ලබා දීම	26
කාර්මික ක්‍රියාවලි අධීක්ෂණ සේවා	67
උපකරණ ක්‍රමාංකනය සහ හරස් පරීක්ෂාව	09
බලශක්ති විගණනය	01
නව නිපැයුම්කරුවන් සඳහා ඉන්කියුබේටර් සේවා	18

විවිධ රසායනාගාර සේවා

ක්‍රියාකාරකම් වර්ගය	සේවා ගණන
සිවිල් ඉංජිනේරු පරීක්ෂණ රසායනාගාර පරීක්ෂණ	117
අපජල සාම්පල විශ්ලේෂණය	65
විදුලි ලාම්පු පරීක්ෂාව	48
ශීතකරණ පරීක්ෂාව	4
මෝටර් රථ බැටරි පරීක්ෂාව	4

8.2.2 සංවර්ධන හා ව්‍යාපෘති දෙපාර්තමේන්තුව (DPD)

සංවර්ධන සහ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව (DPD) රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සහ පුද්ගලයන් ඇතුළු කාර්මික අංශයට විවිධ විෂයයන් යටතේ NERDC-සංවර්ධිත තාක්ෂණයන් භාවිතාකර සේවාවන් සැපයයි. සාමාන්‍යයෙන්, DPD විසින් NERDC ආශ්‍රිත පිරිවැය-ඵලදායී ගොඩනැගිලි ඉදිකිරීම්, අඩි පාලම්, රැඳවුම් බිත්ති, ආදාහනාගාර, දාහක, ජීව වායු ජනක යන්ත්‍ර, සහ සැලසුම් සහ උපදේශන ඇතුළු යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය වැනි දියුණු තාක්ෂණයන්හි සේවාවන් භාර ගනී.

සංවර්ධන හා ව්‍යාපෘති දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද වාණිජ කටයුතුවල සාරාංශය

අංක	වාණිජ කටයුතු	මුළු වාණිජ වටිනාකම (රු.)
1.	සිවිල් ඉංජිනේරු උපදේශන සේවා	1,916,574
2.	ගොඩනැගිලි සහ ව්‍යුහයන් ඉදි කිරීම	37,417,191
3.	කොන්ක්‍රීට් නිෂ්පාදන විකිණීම	2,214,990
4.	නිෂ්පාදන නිෂ්පාදනය සහ සැපයීම, ඉදිකිරීම්, නිෂ්පාදනය, ස්ථාපනය, අළුත්වැඩියා කිරීම සහ පැලෑටි වැඩි දියුණු කිරීම සහ ආදාහන කරුවන්ගේ කාලාන්තර සේවා	9,508,299







රාජගිරිය දේශීය අයුරුවේද වෛද්‍ය පීඨයේ (IIM) අර්ධ ස්ථිර ගොඩනැගිල්ල තෙමහල් ගොඩනැගිල්ලක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම -පළමු අදියර



පාලම් ඉදිකිරීම - සිවිල් ඉංජිනේරු ඇලුම්නි - මොරටුව විශ්ව විද්‍යාලය

ක්‍රියාකාරකම	**උප ක්‍රියාකාරකම්**	**ඇස්තමේන්තුගත ආදායම 2022 (LKR, බදු නොමැතිව)**
සිවිල් ඉංජිනේරු උපදේශන සේවා සැපයීම	**එකතුව**	**2,221,573.71**
	සිවිල් ඉංජිනේරු උපදේශන සේවා සැපයීම (ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු 2022 දී අඛණ්ඩව පැවතුණි.)	29,500.00
	ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු	310,707.04
	සිවිල් ඉංජිනේරු සැලසුම් සහ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම	
	කළුතර - වාද්දුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත සිවිල් ඉංජිනේරු උපදේශන සේවා සැපයීම. (ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු 2022 දී අඛණ්ඩව ක්‍රියාත්මක විය.)	1,000,000.00
	ITI හි චීන ජෛව තාක්ෂණ විද්‍යාගාරය සඳහා උපදේශන සේවා සඳහා සිවිල් ඉංජිනේරු උපදේශන සේවා සැපයීම. (ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු 2022 දී අඛණ්ඩව පැවතුණි.)	89,700.00
	Express News Papers (Ceylon)(Pvt) ltd සිවිල් ඉංජිනේරු උපදේශන සේවා සැපයීම	
	රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට සිවිල් ඉංජිනේරු උපදේශන සේවා සැපයීම	
සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් සේවා	**එකතුව**	**85,441,983.77**
	පාලම් ඉදිකිරීම - සිවිල් ඉංජිනේරු ඇලුම්නි - මොරටුව විශ්වවිද්‍යාලය (ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු 2022 දී අඛණ්ඩව සිදු විය.)	404,951.19
	රාජගිරිය IIM දේශීය වෛද්‍ය ආයතනයේ දේශන ශාලා ගොඩනැගිල්ල සහ ආපනශාලා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම. (ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු 2022 දී අඛණ්ඩව පැවතුණි.)	10,037,032.58
	දේශීය වෛද්‍ය ආයතනයේ පැරණි අර්ධ ස්ථිර ගොඩනැගිල්ල තෙමහල් ගොඩනැගිල්ලක් බවට ප්‍රතිසංස්කරණය කිරීම දේශීය වෛද්‍ය ආයතනය-IIM	
පෙරනිමි සහ පෙරසවි කොන්ක්‍රීට් අයිතම	**එකතුව**	**2,214,990.08**
සුළු උපදේශන, ඉදිකිරීම්, නිෂ්පාදන, ස්ථාපනය සහ අනෙකුත් සේවා (සිවිල් ඉංජිනේරු විද්‍යාව හැර)	**එකතුව**	**10,754,733**

සුළු උපදේශන, ඉදිකිරීම්, නිෂ්පාදන, ස්ථාපනය සහ අනෙකුත් සේවා (සිවිල් ඉංජිනේරු විද්‍යාව හැර)	ගම්මිරිස් බීජ වෙන්කරණ යන්ත්‍රය නිපදවා විකිණීම	31,481.50
	ගම්මිරිස් බීජ වෙන්කරණ යන්ත්‍රයක් සාදා විකිණීම	31,481.50
	ඔසු පත්‍ර සහ බීජ කුඩුකරණ යන්ත්‍රයක් සාදා විකිණීම	109,000.00
	මඤ්ඤොක්කා පෙති කපන යන්ත්‍රයක් සාදා විකිණීම	38,000.00
සුළු උපදේශන, ඉදිකිරීම්, නිෂ්පාදන, ස්ථාපනය සහ අනෙකුත් සේවා (සිවිල් ඉංජිනේරු විද්‍යාව හැර)	ගඩොල් කපන යන්ත්‍රයක් සාදා විකිණීම.	184,910.71
	රාජ්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද රෝහලට තෙල් සිදීමේ යන්ත්‍රයක් සාදා විකිණීම	186,000.00
	සීමාසහිත රයිනෝ සෙවිලි නිෂ්පාදන ආයතනයේ ජීව වායු බලාගාරය පරීක්ෂා කිරීම	10,000.00
	කුඹුරුපිටිය මූලික රෝහලේ වායු සමීකරණ ඒකක සඳහා ස්ථාන පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීම	60,000.00
	තේ පර්යේෂණ ආයතනයේ ජීව වායු බලාගාරය පරීක්ෂා කිරීම	15,000.00
	හයිඩ්‍රොලික් ජැක් මගින් කරන ලද යුෂ නිස්සාරක යන්ත්‍රය නිෂ්පාදනය කර සැපයීම.	108,500.00
	යුනි නැවුරල් (පෞද්ගලික) සමාගමට බෙහෙත් කුඩු කරන යන්ත්‍රයක් සාදා සැපයීම.	183,000.00
	අම්බලන්ගොඩ UC ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම	450,000.00
	උඩුබද්දාව ප්‍රාදේශීය සභාව ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම	450,000.00
	තල් යුෂ නිස්සාරක යන්ත්‍රයක් නිෂ්පාදනය සහ සැපයීම (අංක 10)	2,491,000.00
	අත්තනගල්ල ආදාහනාගාරය සඳහා ද්විතියික කුටියක් ඉදිකිරීම	2,570,000.00
	යටිනුවර ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම	600,000.00
	බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම	800,000.00
	වත්තේගම නගර සභාවෙහි ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම	675,000.00
	මෝටර් බයිසිකල් වැසි රාමුවක් සඳහා තත්ත්ව පරීක්ෂාව සිදුකර වාර්තාවක් ඉදිරිපත් කිරීම	490,000.00
	හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව, වලපනේ ප්‍රාදේශීය සභාව, කරන්දෙණිය ප්‍රාදේශීය සභාව සහ බෙන්තොට ප්‍රාදේශීය සභාව ආදාහනාගාරය සඳහා වාර්ෂික නඩත්තු සේවා සහ පුහුණු වැඩසටහන්	491,084.25

8.2.3 තාක්ෂණික අළෙවි දෙපාර්තමේන්තුවෙන් ලබාදුන් සේවාවන්

- 2022 වසර සඳහා තාක්ෂණ පැවරුම්

අංකය	ක්‍රියාකාරකම්	ප්‍රමාණය
01	ව්‍යවසායකයින් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර	34
02	බලපත්‍ර අලුත් කිරීම	94
03	තාක්ෂණ පැවරුම් පුහුණු වැඩසටහන්	07

- **තාක්ෂණික අළෙවි දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන තාක්ෂණ ක්‍රියාකාරකම්**

අංකය	ක්‍රියාකාරකම්	ප්‍රමාණය
01	ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රණ මාධ්‍ය ක්‍රියාකාරකම්	10
02	ප්‍රකාශිත ලිපි	22
03	පුවත් පත්‍රිකා	04
04	සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම්	17
05	දැනුවත් කිරීමේ වැඩසටහන්	22
06	ප්‍රදර්ශන	05
07	බලපත්‍රලාභීන්ගේ අධීක්ෂණය	16
08	නිෂ්පාදන දියත් කිරීම්	01
09	බලපත්‍ර සංසඳ පැවැත්වීම	01

- **පේටන්ට් ක්‍රියාවලිය**

පේටන්ට් බලපත්‍රය ගොනු කිරීම්

අංකය	පේටන්ට් බලපත්‍රය
01	දොරකඩ සඳහා අත් සනීපාරක්ෂාව අනුකූලතා අනතුරු ඇඟවීමේ පද්ධතිය

ලබාගන්නා ලද පේටන්ට් බලපත්‍ර

අංකය	පේටන්ට් බලපත්‍ර
01	සෝඩියම් කාබොක්සි මෙතිල් සෙලියුලෝස් (NaCMC) සෑදීම සඳහා ඉරිඟු ලෙලි සහ බැග්ස් ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් බලශක්ති ඉතිරිකිරීමේ ක්‍රමයක්.
02	සම්පීඩිත ස්ථායී පෘථිවි කුට්ටි (CSEB) සඳහා තීන්ත නිෂ්පාදනය කිරීමේ ක්‍රමය
03	ස්වයංක්‍රීය නැවුම් කිරි එකතු කරන යන්ත්‍ර සේදීමේ යන්ත්‍රය
04	කර්මාන්ත සඳහා ගෙඩි වලින් පොල් ලෙලි ඉවත් කිරීමේ යන්ත්‍ර

- **තාක්ෂණ උද්‍යානයේ සහ ඉංජිනේරු කෞතුකාගාරයේ ක්‍රියාකාරකම්**

අංකය	ක්‍රියාකාරකම්	ප්‍රමාණය
01	තාක්ෂණ උද්‍යානය සහ ඉංජිනේරු කෞතුකාගාරයට නරඹන්නන්	2751
02	විශේෂ අධ්‍යයන වැඩසටහන්	13
03	ගුරුවරුන් සඳහා ගණිත කැෆේ වැඩසටහන්	04



09.

2022 වර්ෂයේ මධ්‍යස්ථානයේ මූල්‍ය සමාලෝචනය

9.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 මූල්‍ය වාර්තා පිළියෙල කරන පදනම

මෙහි සමන්විත මූල්‍ය ප්‍රකාශන මත මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සාදා ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලවය.

සමාලෝචිත වර්ෂය ලෙස සලකා ඇත්තේ 2022.01.01. සිට 2022.12.31 කාලපරිච්ඡේදයය.

1.2 අගය කරලීම හා ගිණුම්ගත කරන පදනම

මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශණය,ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම හා ඓතිහාසික පිරිවැය සංකල්ප මත පදනම්වය.

1.3 ගණුදෙණු ක්‍රියාත්මක වූ හා ඉදිරිපත් කරන මූල්‍ය ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පිළිබිඹු වන ගණුදෙණු සිදු කර ඇත්තේ හා ඉදිරිපත් කර ඇත්තේ මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයෙහි භාවිතා වන මූල්‍ය ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. එසේ නොවන අවස්ථාවකදී ඒ පිළිබඳ වෙනම දක්වා ඇත.

1.4 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ 2022.12.31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදයටය. මෙහිදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ගිණුම්කරණ සටහන් ප්‍රවර්ථන කාලපරිච්ඡේදය හා සැසඳිය හැකි වනු ඇත.

පිටු අංක 33-34 දක්වා ඇති පරිදි පූර්ව වර්ෂ ගැලපීම් වල බලපෑමට නතුව සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, එසේ එම බලපෑම මත වෙනස්කම් සිදුකරනු ලැබුවා වූ සංසන්දනාත්මක තොරතුරු " යලි සකසන ලද " යන උද්ධෘතය යටතේ ඉදිරිපත් කර ඇත.

1.5 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චය කරලීම, ඇස්තමේන්තු හා උපකල්පනයන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුව මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති, වත්කම්, වගකීම්, ආදායම්, අසම්භව්‍ය වගකීම් හඳුනාගැනීම් සම්බන්ධයෙන් කළමණාකරණ විනිශ්චය කරලීම් ඇස්තමේන්තුගත කරලීම හා උපකල්පනයන් භාවිතා කර ඇත. කෙසේ නමුත් උපකල්පනයන් හා ඇස්තමේන්තු සම්බන්ධයෙන් වන අවිනිශ්චිතතාවයන් මත ඉදිරිපත් කරන ලද වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක ගැලපීම් ඉදිරි කාලපරිච්ඡේදයක සිදු විය හැක. මෙහිදී මධ්‍යස්ථානයේ ඉදිරි අනාගත අඛණ්ඩ පැවැත්ම හා සම්පත් ප්‍රමාණාත්මකභාවය පිළිබඳව කළමණාකාරිත්වය නිසි ඇගයීමක පිහිටා ඇත. තවදුරටත් මධ්‍යස්ථානයේ පැවැත්ම පිළිබඳව බලපාන අවින්ශ්චිත තත්වයක් හෝ සැකයක් කළමණාකාරිත්වය වෙත නොමැත. මෙනිසා මූල්‍ය ප්‍රකාශ සාදා ඇත්තේ අඛණ්ඩ පැවැත්ම යන පදනම මතය.

2. දේපල හා පිරියත

2.1 හඳුනාගැනීම හා මැනීම

පිරියත ලෙස ගෙන ඇත්තේ සෘජුව මිළදී ගැනීම් සඳහා අදාල වන වියදම්ය. මධ්‍යස්ථානය විසින්ම ගොඩ නංවා ගනු ලැබූ වත්කම්වල පිරිවැය ලෙස ඒවායේ අභිලාෂගත අරමුණු ඉටුවන මට්ටම දක්වා දරණ ලද අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය හා අනෙකුත් සෘජුව හඳුනාගත හැකි වියදම් පිරිවැය ලෙස සලකනු ඇත. ප්‍රාග්ධන ප්‍රතිසංස්කරණ ගොඩනැංවීම් වලදී ගොඩනැගිලි ඉවත්කරලීම් පිරිවැය හා අදාල පරිදි ණය පොලී පිරිවැය ප්‍රාග්ධනිත කරනු ඇත. යම් ප්‍රාග්ධන භාණ්ඩයක අත්‍යාවශ්‍ය අංගයක් ලෙස මෘදුකාංග පවතින විට එම මෘදුකාංග පිරිවැය අදාල භෞතික උපකරණය සමඟම ප්‍රාග්ධනිත කෙරේ. ප්‍රාග්ධන භාණ්ඩවල අනුයුක්ත කොටස් සඳහා වෙන වෙනම වූ ඵලදායී ජීවිත කාලයක් ඇති අවස්ථාවකදී එම භාණ්ඩයන් වෙන වෙනම හඳුනා ගැනේ. ස්ථාවර වත්කම් බැහැර කරලීමේ දී ජනිත වන ලාභ හෝ අලාභ හඳුනා ගැනෙන්නේ එම වත්කමේ විකුණුම් මිළ හා පොත්වල ඇති ශුද්ධ අගය සැසඳීමෙනි. මෙම උපලබ්ධි ලාභය/අලාභය අමතර ආදායම් හෝ අමතර වියදම් ලෙස හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් භරලන අවස්ථාව වන විටදී ඒ හා අදාල අගයක් ප්‍රත්‍යාගණන සංචිතය තුල පවතින්නේ නම් එය ඉදිරියට ගෙනා රදවාගත් ඉපැයුම් ශේෂය සමඟ ගැලපේ.

2.2 ප්‍රත්‍යාගණනය

මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කිරීම සඳහා දේපල හා පිරියත සමගාමීව ප්‍රත්‍යාගණනය කරනුයේ එකම කාණ්ඩයට අයත් වත්කම් තෝරාගෙන වටිනාකම් හා දින අතර ඇති වෙනස ඉවත් කිරීමටය.

වත්කම් කාණ්ඩවල ප්‍රත්‍යාගණනය පෙරෙලෙන පදනමක් යටතේ ප්‍රත්‍යාගණනය කරනුයේ වත්කම් කාණ්ඩ වල අගය සුලු කාලයක් ඇතුලතදී යාවත්කාලීන කිරීමටය.

දේපල හා පිරියත වල සාධාරණ අගය සාමාන්‍යයෙන් නිර්ණය කරන්නේ වෙළඳ අගය පදනම් කරගෙනය. වත්කම් වල ඇගයීම සිදු කරනු ලබන්නේ අගයන් පිළිබඳ වෘත්තීමය දැනුමක් ඇති කණ්ඩායමක් විසිනි. වත්කම් වැඩි ප්‍රමාණයක සාධාරණ අගය ගනු ලබන්නේ වෙළඳපොලේ සඳහන් මිල අනුවය.

ප්‍රත්‍යාගණනය කිරීමේදී වත්කම් කාණ්ඩ වල අගයෙහි වැඩිවීමක් ලැබූ විට එය ප්‍රත්‍යාගණන අතිරික්තයක් ලෙස පෙන්වයි. කෙසේ වෙතත් ඌනතාවයක් පෙන්නුම් කරන අවස්ථාවේදී අතිරික්තය සමතුලිත වන සේ ඌනතාවය කපා හැරේ. ප්‍රත්‍යාගණන අතිරික්තය එකම කාණ්ඩයක් යටතේ ඇති වත්කම් වලින් කපා හැරීම මිස වෙනත් කාණ්ඩයක ඇති අතිරික්ත වලින් කපා හැරීම සිදු නොකෙරේ.

2.3 ක්ෂය කරලීම

වත්කම් ක්ෂය කරලීම වත්කම් වල පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කරලීමෙන් අනතුරුව එන අගය මත පදනම් වනු ඇත. යම් වත්කමක් සංයුතියෙහි ඇති ප්‍රමාණාත්මක වැදගත් අංශයන්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය විවිධ වන අවස්ථාවලදී ඒවා වෙන වෙනම ක්ෂය කරලීමට භාජනය කරනු ඇත. වත්කම් වල ක්ෂය ඒවායේ ඇස්තමේන්තුගත ජීවිත කාලය තුල ලාභාලාභ ගිණුමෙහි පෙන්වනු ඇත. සලකා බලන වර්ෂයේදී හා පසුගිය වර්ෂයේදී මෙම ඇස්තමේන්තුගත අනුපාතයන් පහත පරිදිය.

වත්කම් කාණ්ඩය	ක්ෂය%
ඉඩම් - සටහන අංක 1	
ගොඩනැගිලි	2.5
කාර්යාල උපකරණ	15
උපකරණ	15
ප්‍රදර්ශන භාණ්ඩ	15
පරිසණක යන්ත්‍ර	331/3
රථ වාහන	15
ලී බඩු උපකරණ	10
යන්ත්‍රෝපකරණ සහ විද්‍යාගාර පහසුකම්	15
පුස්තකාල පොත්	05
යටිතල පහසුකම්	15
මෘදුකාංග	33 1/3

ඉඩම් (සටහන අංක 1)

වසර 50 ක කුලී පදනම මත 2028 අගෝස්තු 13 දින දක්වා ගිවිසුම් ගත කාල සීමාවකට අක්කර 9,රූඩ් 3 පර්චර්ස් 19ක භූමි ප්‍රමාණයක් සන්තකය.

2.4 පොත්වලින් ඉවත්කරලීම

වත්කමක ගෙන යන අගය පොත්වලින් ඉවත්කරලීම එහි අනාගත ඇස්තමේන්තුගත ප්‍රතිලාභ නොමැති විටදී හෝ එය ඉවත් කරනු ලබන විටකදී සිදු කරනු ඇත. වත්කම් බැහැර කරන අවස්ථාවකදී සිදුවන ලාභ හා පාඩු, වත්කම් වල විකුණුම් අගය හා ශුද්ධ අගය අතර වෙනස සැසඳීමෙන් ගන්නා අතර එය මෙහෙයුම් වාර්තාවන්හි අනෙකුත් ආදායම් යටතේ දක්වනු ඇත.

2.5 අස්පෘශ්‍ය වත්කම්

මධ්‍යස්ථානය විසින් අත්පත් කරගන්නා ලද නිශ්චිත ජීවන කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් අගය කරනු ලබන්නේ පිරිවැයෙන් ඒවායේ ක්‍රම ක්ෂය හා මුලු අගය අඩුවීම්ද ගැලපීමෙනි. අනතුරුව ලැබෙන වියදම් ප්‍රාග්ධනීත කරනු ලබන්නේ එම වියදම නිසා අදාල අස්පෘශ්‍ය වත්කමෙහි අනාගත ප්‍රතිලාභ ලැබීම වර්ධනය වන ස්වරූපයක් ඇති නම් පමණි. ක්‍රම ක්ෂය කරනු ලබන්නේ පිරිවැය හා අවශේෂ අගය අතර වෙනසටය. ක්‍රම ක්ෂය අගය මෙහෙයුම් ප්‍රකාශයන්හි සරල මාර්ග ක්ෂය ක්‍රමයට අදාල අනුපාතය මත පෙන්නුම් කෙරේ. භායනය කරනු ලබන්නේ අස්පෘෂ්‍ය වත්කම මධ්‍යස්ථානයේ භාවිතයට ගත් දින සිටය. අස්පෘෂ්‍ය වත්කමෙහි ඇස්තමේන්තුගත අනුපාතයන් සමාලෝචිත වර්ෂයන් හා සංසන්දනාත්මකව පහත දී ඇත.

3. තොග

තොග අගය කර ඇත්තේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අවමය සලකාය. තොග පිරිවැය FIFO තොග නිකුත් කරලීමේ මූලධර්ම මත පදනම්ව ඇත. තොගයන් වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා දරනු ලැබූ වියදම් ඒවායේ පිරිවැය ලෙස ඇත.

රසායනාගාර තොග හා කෙරීගෙන යන වැඩ ඒවායේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන්නෙන් අඩු අගයට ගෙන ඇත.

4. ලැබිය යුතු වෙළඳ ශේෂ

අඩමාන ණය වෙන්කරලීම්

ගණුදෙනුවේ ස්වභාවය, ගණුදෙණු කරුගේ ප්‍රතිචාරය වැනි සාධක මත පදනම්ව සාධාරණ විනිශ්චය මත අඩමාන ණය වෙන්කරලීමක් ලෙස පොත්වල සටහන් කරනු ලබයි. ඒ අනුව කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ව්‍යාපෘතියක් සඳහා අයකර ගත යුතු රු.313,171.36 ක වෙන් කිරීමක් පොත් අගය ලෙස ගෙන තිබේ.

5. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගනු ලබන්නේ අතැති මුදල්, බැංකු මුදල්, තාවකාලික කැඳවුම් තැන්පතු හා රාජ්‍ය ආයතනවල අතිරික්ත තැන්පතු ගිණුම්ය.

6. දෙන ලද ණය හා ලැබිය යුතු ගිණුම්

යම්කිසි ස්ථාවර හෝ නිශ්චිත ගෙවීම් සිදු කරන හා වෙළඳපොල තුල සංසරනය නොවන ණය දීම් මුලින්ම සාධාරණ අගය හා සෘජුව ස්ථාපනය කල හැකි වියදම් මත පදනම්ව හඳුනා ගැනෙනු ඇත.

7. මූල්‍ය වගකීම්

ව්‍යුත්පන්නයන් නොවන මූල්‍යමය වගකීම් අනෙකුත් මූල්‍යමය වගකීම් ලෙස හඳුනා ගැනේ. මෙම අනෙකුත් මූල්‍යමය වගකීම් ලෙස නියෝජනය වන්නේ වෙළඳ ගෙවිය යුතු ගිණුම් හා සම්බන්ධිත පාර්ශවයනට කල යුතු ගෙවීම්ය. මෙම වගකීම් ප්‍රථමයෙන්ම හඳුනාගනු ලබන්නේ සාධාරණ අගයට යම් සෘජුව හඳුනාගත හැකි පිරිවැය ගැලපීමෙනි. මූල්‍ය තත්ව ප්‍රකාශනයේදී මූල්‍ය වගකීම් හා මූල්‍ය වත්කම් එකිනෙකට හිලව් කර පෙන්වනු ලබන්නේ මධ්‍යස්ථානයට ඒ සඳහා නීතිමය අයිතියක් පවතින්නේ නම් පමණි.

8. සේවක ප්‍රතිලාභ වගකීම්

සේවය හැරයාමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ ව්‍යවස්ථාපිතව දක්වා ඇති පරිදි සිදු කර ඇත. සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා මධ්‍යස්ථානයේ දායකත්වය පිළිවෙලින් 15% හා 3% ක් වේ. 1983 අංක 12 දරණ පනත ප්‍රකාරව පාරිතෝෂික වෙන් කර ඇත. පාරිතෝෂික වෙන්කරලීම සඳහා මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන සපයනු ලැබේ. මෙම පාරිතෝෂික වෙන්කරලීම පහත පරිදි ගනනය කෙරේ.

(අවසන් වරට ගත් මූලික වැටුප + ජීවන වියදම් දිමනාව සහ අනෙකුත් අදාල දීමනා x ½ සම්පූර්ණ කර ඇති වර්ෂ ගණන)

9. වෙන්කරලීම්

මින් නියෝජනය වන්නේ අතීතයේදී ඇතිවුනු සිද්ධියක් මත මධ්‍යස්ථානය වෙත වර්තමානයේදී හඳුනාගත හැකි නීතිමය හෝ ඵලදායි ස්වරූපයේ බැඳීම් මත විශ්වාසනීයව පූර්වකථනය කරගත හැකි අනාගත මූල්‍ය පිටතට ගලා යාමය.

10. වෙන්කරලීම්, අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම්

ශේෂපත්‍ර දිනට මධ්‍යස්ථානය වෙත ඇති ප්‍රමාණය ඇස්තමේන්තු කර ගත හැකි, අනාගත සම්පත් පිටව යාමක් විය හැකි බැදියාවන් සඳහා වෙන් කරලීම් තබනු ඇත. අසම්භාව්‍ය වගකීම් සඳහා ශේෂ පත්‍රයේ සටහන් ලෙස දක්වා ඇත.

11. ආදායම් හඳුනා ගැනීම

යම්කිසි ආදායමක් විශ්වාසවන්තව ගණනය කලහැකි නම් හා ඊට අදාල ආර්ථික ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානය වෙත හැකියාවක් ඇති අවස්ථාවේදී ආදායම් හඳුනා ගැනේ. ලැබී ඇති හා ලැබීමට ඇති අගයන්ගේ සාධාරණ අගයට වට්ටම් හා බදු ඉවත් කරලීමෙන් ආදායම් හඳුනා ගනී. ආදායම් හඳුනා ගැනීමේදී පහත දැක්වෙන විශේෂ ලක්ෂණයන් පදනම් කරගෙන ඇත.

a) සංවර්ධිත තාක්ෂණයන් විකිණීම

අදාළ තාක්ෂණයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මකව ප්‍රතිලාභයේ හා අවදානමේ හිමිකාරිත්වයේ අයිතිය මාරු වීම සිදුවන අවස්ථාවේදී ආදායම හඳුනා ගනී. පවරනු ලැබූ තාක්ෂණයන් සම්බන්ධයෙන් පසු කාලින කළමණාකාරිත්ව හෝ පාලන මැදිහත් වීමක් මධ්‍යස්ථානය දරණු නොලැබේ.

b) සේවා සැපයීම

සේවා ආදායම හඳුනාගනු ලබනුයේ අදාල සේවාව ජනනය වූ හෝ කරනු ලැබූ කාල පරිච්ඡේදයටය.

c) කොන්ත්‍රාත් ආදායම

කොන්ත්‍රාත්තුවක ආදායම එහි සමස්ථ ප්‍රතිඵලය විශ්වාසනීයව අගය කල නොහැකි විටකදී කර ඇති වැඩ ප්‍රතිශතය මත ලබා ගනී.

d) බදු

බදු වලට ආදායම් බද්ද, එකතු කල අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද ඇතුලත් වේ. මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන සමාගම් අදාල ප්‍රඥප්ති වලට අනුකූලව එවැනි බදු ගෙවයි. දැනට NBT අදාල නොවන අතර මධ්‍යස්ථානය ස්වේච්ඡා පදනමින් වැට් බදු සඳහා ලියාපදිංචි ආයතනයකි.

e) පොලී ආදායම

උපචිත වන අවස්ථාවේදී පොළී ආදායම හඳුනා ගනී.

f) ජංගම වත්කම් බැහැර කරලීමෙන් ජනිත වන

ලාභ හා අලාභ

ජංගම නොවන වත්කම් වල විකුණුම් මිලෙන් එම වත්කම් වල ශුද්ධ පොත් අගය හා ඒවා බැහැර කරලීමට කරනු ලබන අනෙකුත් වියදම් ද අඩු කරලීමෙන් පසු ලැබෙන ප්‍රතිඵලය ආදායම ප්‍රකාශනයට ගනු ලැබේ. තවද ප්‍රමාණාත්මක වශයෙන් අඩු අගයකින් සමන්විත ජංගම නොවන වත්කම් වල ඉවත් කරලීම එකිනෙකට වෙන වෙනම නොව පොදුවේ ශුද්ධ අගය දක්වනු ලැබේ.

g) අනෙකුත් ආදායම්

අමතර ආදායම් ලෙස තාක්ෂණික පැවරුම් කටයුතු වල ශුද්ධ ලාභය, කැඳවුම් තැන්පතු හා බැදුම්කර පොලී ආදායම කාල ප්‍රමාද දඩ මුදල්, ලබා දී ඇති ණය වලට පොලී, නැවත නොගෙවන තැන්පතු, සැපයුම්කරුවන් ලියාපදිංචි කරලීම, සුළු ආදායම්, හානි වූ තොග විකුණුම්, ජංගම නොවන වත්කම් බැහැර කරලීම් ආදායම හා පොදු කාර්ය අයකර ගැනීම ආදිය ඇතුලත් වේ.

h) විලම්භීත ආදායම

රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් අත්පත් කර ගන්නා ජංගම නොවන වත්කම් වලට අදාල කෂය වෙන් කරලීම් වලින් විලම්භීත ආදායම සමන්විත වේ.

2022වර්ෂයේ ගිණුම්වල, අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් ලද ප්‍රධානයන් මතද පිහිටා විලම්භිත අයභාර හඳුනාගන ඇත. එය පූර්ව වර්ෂ ගැලපීම මගින් විලම්භිත අයභාර ගිණුම්කරණය අනුගත කල පලමු වර්ෂය තෙක් බලපෑම ගිණුම්කරණයට නතු කර ඇත. ඒ අනුව NERD මධ්‍යස්ථානය වෙත ලද සියළුම ප්‍රාග්ධන ප්‍රදානයන් විලම්භිත අයභාර ගිණුම්කරණයට නතුකර ඇත.

12 ප්‍රදානයන්

ප්‍රදානයන් ලෙස ආදායම් ප්‍රකාශන වල දක්වනු ලබන්නේ ලැබීම සඳහා සාධාරණ සහතික වීමක් ඇති හා ලබා ගැනීම උදෙසා මධ්‍යස්ථානය විසින් සියළුම කොන්දේසි සපුරා ඇති විටකදිය. ප්‍රදානයන් ලැබීමේදි එය අදාල කාල පරිච්ඡේදයේදි ආදායමක් ලෙස සලකා එමගින් ආවරණය වන වියදම් සමඟ ගලපා ඇත. යම්කිසි ස්ථාවර වත්කමක් ලබා ගැනීම සඳහා අදාල වන පරිදි ලැබී ඇති ප්‍රදානයන් මත විලම්භීත ආදායම් ගණනය කෙරේ. මධ්‍යස්ථානයට මූල්‍ය නොවන ප්‍රදානයන් ලැබීමේදී සාධාරණ අගය මත ගණනය කරනු ලැබේ.

ප්‍රාග්ධන ප්‍රදානයන් භාවිතය ප්‍රධාන වර්ගීකරණ ද්විත්වයකට ගොනු කර ඇත. පලමුවෙන් වත්කම් අත්පත්කර ගැනීම් හා වත්කම් පුනරුත්ථාපනය කරලීම වැනි භෞතික පැවැත්මක් සහිත, ශේෂපත්‍රය තුල නියෝජනය වන වත්කම් අත්පත්කර ගැනීම සඳහා භාවිතයන් හා ප්‍රාග්ධන අරමුදල් යොදවා ශේෂපත්‍ර අයිතමයන් නොවන, බලපෑම අවසානයේදී මෙහෙයුම් ප්‍රකාශනය තුලින් කපා හැරෙන ස්වරූපයේ භාවිතයන් වන මානව කුසලතා ඔප නැංවීම, දායකත්වය,ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම් හා පර්යේෂණ සංවර්ධන වියදම් භාවිතයන්ය. ඒ අනුව හිමිකම් ප්‍රකාශනයේ දක්වනු ලබන්නේ ශේෂපත්‍රය තුල නියෝජනය වන වත්කම් අත්පත් කර ගැනීමට දරණ වියදම්ය.

ප්‍රවර්තන වසර තුලදී රු.13,720,000.00වන ප්‍රාග්ධන ප්‍රදාන හා රු. 301,800,000.00 වන ප්‍රවර්ථන ප්‍රදානයන් භාණ්ඩාගාරයෙන් ලැබුනි.

ප්‍රදානයන් මත වන අසම්භාව්‍ය වගකීම්

